## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරු සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ පටිපාටිය සබරගමුව පළාත් සභාව.

තෝරා ගැනීමේ පදනම වන්නේ අයදුම්කරුවන් නියමිත ආකෘතිය අනුව යොමු කර ඇති අයදුම්පත්වල ඉදිරිපත් කර ඇති තොරතුරු මත පදනම්ව ජ්‍යෙෂ්ඨත්වය, ක්ෂේත්‍රයේ පළපුරුද්ද, වෘත්තීයේ සුදුසුකම්වලට සහ සම්මුඛ පරීක්ෂණයේ ලබා ගන්නා කුසලතා සාමාර්ථය ඇගයීමට ලක් කිරීමෙනි.

| අ.අං | මාතෘකාව | උපරිම ලකුණු |
|---|---|---|
| **01** | **ජ්‍යෙෂ්ඨත්වය**<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියට උසස් වීමෙන් පසු එක් වසරකට ලකුණු 10 බැගින් උපරිම වසර 5ක් දක්වා. | **50** |
| **02** | **ක්ෂේත්‍රයේ /ක්ෂේත්‍රවල පළපුරුද්ද**<br>**2.1** **අධ්‍යාපන පරිපාලනය**<br>2.1.අ. විදුහල්පති (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුරක් දැරිය යුතු පාසලක එක් වසරක සේවා කාලයකට ලකුණු 01 බැගින් උපරිම වසර 05ක් සඳහා)<br>2.1.ආ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරක රාජකාරි කිරීම. එක් වසරක සේවා කාලයකට ලකුණු 01 බැගින් උපරිම වසර 5ක් සඳහා<br>**2.2.** **අධ්‍යාපන සංවර්ධනය**<br>**2.2.අ.**<br>අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඵලදායීතාව, කාර්යක්ෂමතාව, සේවා ලබා දීමේ කාර්යක්ෂමතාව වැනි අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් නිලධාරියා විසින් සෘජුව දායකත්වයක් දක්වා ඇති ව්‍යාපෘතීන් සඳහා ලබා දී ඇති සේවා ඇගයීම්/ ප්‍රශංසා සහතික/සම්මාන සහතික හා ජයග්‍රහණ<br>එක් විෂය ක්ෂේත්‍රයකට අදාළව ලකුණු 01 බැගින් උපරිම ලකුණු 05කි.<br>**2.2.ආ.**<br>පූර්වාසන්න වසර 05ක කාර්ය සාධන වාර්තා උපරිම ලකුණු 05<br>i. කාර්ය සාධනය ඇගයුම සතුටුදායක නම් ලකුණු ½ බැගින්<br>ii. කාර්යය සාධන ඇගයුම සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ හෝ ඊට වැඩි නම් ලකුණු 01 බැගින් | **20** |

| | | |
|---|---|---|
| 03 | **වෘත්තීය සුදුසුකම්**<br><br>**3.1 අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම**<br><br>i. පර්යේෂණයක් මත පදනම් වන පශ්චාත් උපාධිය -ලකුණු 05<br>ii. පශ්චාත් උපාධිය (පර්යේෂණ රහිත) -ලකුණු 04<br>iii. පශ්චාත් උපාධි ඩිප්ලෝමා -ලකුණු 03<br>iv. උපාධි/පශ්චාත් උපාධි සහතික -ලකුණු 02<br><br>**(3.2) අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රයට අදාල පුහුණුව**<br><br>i. මාස 03ක හෝ ඊට වැඩි කාලයක -ලකුණු 03<br>ii. දින 10ක හෝ ඊට වැඩි කාලයක -ලකුණු 02<br>iii. දින 03ක හෝ ඊට වැඩි කාලයක් -ලකුණු 01<br><br>**(3.3) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය**<br><br>අ) රජයේ පිළිගත් විශ්ව විශ්වවිද්‍යාලයකින් හෝ රාජ්‍ය පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක්/ලකුණු 6.5 හෝ ඊට වැඩි සමස්ථ කාර්ය සාධනයක් සහිත IELTS සාමාර්ථය/ TOFEL– CBT 79 හෝ ඊට වැඩි, TOFEL – CBT 213 හෝ ඊට වැඩි TOFEL- PBT හෝ ඊට වැඩි<br>-ලකුණු 02<br><br>ආ) පිළිගත් වශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂා සහතික පත්‍රය -ලකුණු 01<br><br>❖ **ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.** | 10 |
| 04 | **ශක්තීන්**<br><br>**4.1** අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඵලදායිතාව, කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට යෝජනා කරන නියාමන හා ආයතනික වෙනස්කම් ඇසුරින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල යොමු කරන ප්‍රශ්ණවලට පිළිතුරු ලබා දීම. - උපරිම ලකුණු 05<br><br>i. නිර්මාණශීලිත්වය<br>ii. ක්‍රියාවලි/ක්‍රමවේද සංවර්ධන හැකියාව<br>iii. සන්නිවේදන කුසලතාවය<br><br>**4.2 පර්යේෂණ හා නවෝත්පාදන**<br><br>අ) පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක පළ වූ අදාල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියවුණු පර්යේෂණ පත්‍රිකා, සඟරා, ලිපි, ප්‍රකාශන - ලකුණු 01 බැගින් උපරිම ලකුණු 03<br><br>ආ) වැඩ වපසරිය තුල සාර්ථකව ක්‍රියාත්මක කරන ලද නවෝත්පාදන/තොරතුරු තාක්ෂණික සැකසුම් සංවර්ධනය උපරිම ලකුණු 02<br><br>(ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ). | 10 |
| 05 | **චර්යාත්මක නිපුණතා**<br><br>ක්ෂේත්‍රයට අදාළ යථාර්තවාදී සිද්ධි අධ්‍යයනයක් සහිත පත්‍රිකාවක් අහඹුලෙස ලබා ගෙන අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දී අයදුම්කරු විසින් එය හසුරුවන ආකාරය අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අසන ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු ඇසුරින් ලකුණු ලබා දීම<br><br>i. කළමනාකරණ කුසලතා<br>ii. තීරණ ගැනීමේ හැකියාව<br>iii. අන්තර් පුද්ගල සම්බන්ධතාවය/සහයෝගිතා කුසලතා | 10 |